සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2021 ජූලි

## (103) ආර්ථික විද්‍යාව

(Economics)

2021-10-30
පස්වරු
[02.00 – 05.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  - (1) ***දී ඇති කාලය :*** *පැය 03 යි.*
  - (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  - (3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*
  - (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  - (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  - (6) ***ප්‍රස්තාර කොළ*** *සපයනු ලැබේ.*
  - (7) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  - (8) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 40)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් ඒවා අතුරෙන්, සූක්ෂ්ම ආර්ථික විද්‍යාවේ (Micro-Economics) සංරචකයක් (component) වන්නේ කුමක් ද?

(1) සමාහාර නිමවුම.
(2) පාරිභෝගිකයන් හෝ කුටුම්භයන්.
(3) උද්ධමනය.
(4) සේවා වියුක්ති මට්ටම.

**1.2** කිසියම් කාලයක් තුළ යම්කිසි භාණ්ඩයකින් අමතර ඒකකයක් පරිභෝජනය කිරීමෙන් කිසියම් පුද්ගලයෙකුට ලැබෙන අතිරේක තෘප්තිය හඳුන්වනු ලබන්නේ:

(1) මුළු උපයෝගිතාවය ලෙසයි.
(2) ආන්තික පිරිවැය ලෙසයි.
(3) ආන්තික උපයෝගිතාවය ලෙසයි.
(4) මුළු පිරිවැය ලෙසයි.

1.3 දෙනලද භාණ්ඩයක මිල වෙනස්වන ප්‍රතිශතයට සාපේක්ෂව ඉල්ලුම් ප්‍රමාණයේ සිදුවන වෙනසේ ප්‍රතිශතය අඩුවන විට, එම දෙනලද භාණ්ඩයට ඇති ඉල්ලුම:

(1) අනම්‍ය වේ. (2) නම්‍ය වේ. (3) ඒකීය නම්‍ය වේ. (4) පූර්ණ නම්‍ය වේ.

1.4 පහත සඳහන් ඒවා අතුරෙන්, සැලසුම්ගත ආර්ථිකයක (Planned Economic System) ලක්ෂණයක් **නොවන්නේ** කුමක් ද?

(1) මධ්‍යගත සැලසුම්කරණ පද්ධතියක් මත පදනම්ව මූලික ආර්ථික ප්‍රශ්න විසඳනු ලබයි.

(2) දේපළ හිමිකාරිත්වය රාජ්‍ය අංශය සතු වේ.

(3) සාධාරණ ආදායම් ව්‍යාප්තියක් පැවතීම.

(4) පාරිභෝගික ස්වාධිපත්‍යයක් පැවතීම.

1.5 සැපයුම් වක්‍රය වමට විතැන් කරනු ලබන සාධකයක් වන්නේ:

(1) තාක්ෂණයේ දියුණුවයි.

(2) නිෂ්පාදනයට යොදා ගන්නා සාධකයන්හි මිල අඩු වීමයි.

(3) රජය විසින් දෙනු ලබන නිෂ්පාදන සහනාධාරයි.

(4) අනාගතයේදී භාණ්ඩයේ මිල ඉහළ යනු ඇතැයි නිෂ්පාදකයින් අපේක්ෂා කිරීමයි.

1.6 පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය ප්‍රතිපත්තියේ ප්‍රමාණාත්මක උපකරණයක් වන්නේ කුමක් ද?

(1) සංචිත අනුපාත ප්‍රතිපත්තිය. (2) ණය සඳහා උපරිම කල් පිරීමේ සීමා පිහිටුවීම.

(3) ඇප සුරැකුම් සඳහා සීමා පිහිටුවීම. (4) ශිෂ්ඨ ප්‍රයෝග (Moral suasion).

1.7 පහත සඳහන් ඒවා අතුරෙන්, මුදල් වෙළෙඳපොළේ උප වෙළෙඳපොළක් **නොවන්නේ** කුමක් ද?

(1) භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ. (2) වාණිජ පත්‍රිකා වෙළෙඳපොළ.

(3) අන්තර් බැංකු ඒක්ෂණ ණය මුදල් වෙළෙඳපොළ. (4) කොළඹ කොටස් හුවමාරුව.

1.8 පහත සඳහන් ඒවා අතුරෙන්, මුදලේ කාර්යයක් **නොවන්නේ** කුමක් ද?

(1) උද්ධමනය පාලනය කිරීමේ මාධ්‍යයක් වීම. (2) වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම.

(3) ගිණුම් ඒකකයක් ලෙස කටයුතු කිරීම. (4) විලම්බිත ගෙවුම් මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම.

1.9 පුළුල් මුදල් සැපයුමට අනේවාසික විදේශ ව්‍යවහාර ගිණුම්වල ඇති කාලීන සහ ඉතුරුම් තැන්පතු ප්‍රමාණයෙන් 50% ක් හා විදේශ ව්‍යවහාර බැංකු ඒකකවල ඇති නේවාසිකයන් සතු කාලීන හා ඉතුරුම් තැන්පතු ප්‍රමාණය එකතු වීමෙන් සෑදෙන මුදල් සැපයුම හඳුන්වනු ලබන්නේ:

(1) පටු මුදල් සැපයුම ලෙසයි. (2) මුදල් පදනම ලෙසයි.

(3) ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ලෙසයි. (4) වඩාත් පුළුල් මුදල් සැපයුම ලෙසයි.

**1.10** 2020 වර්ෂය සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව, 2020 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය වූයේ:

(1) 2.4%. (2) -3.6%. (3) 1.3%. (4) -1.8%.

*අංක **1.11** සහ **1.12** ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා වරහන් තුළ දී ඇති උත්තර දෙක අතුරින් නිවැරදි උත්තරය තෝරාගන්න. තෝරාගත් උත්තරය ප්‍රශ්න අංකය සමඟ, උත්තර පොතේ ලියන්න.*

**1.11** නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයේ උපකල්පනයක් වනුයේ තාක්ෂණය ……………… *(නොවෙනස්ව / වෙනස්වෙමින්)* පවතින බවයි.

**1.12** කාර්යක්ෂමතාවය සහ ස්ථායිතාවය, තිරසාර සංවර්ධනයේ ……………… *(ආර්ථික / සමාජීය)* පැතිකඩයේ උප-සංරචකයන් වේ.

*අංක **1.13** සහ **1.14** ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.13** වෙළෙඳපොළෙහි ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන් විශාල පිරිසක් සිටින වෙළෙඳපොළ ව්‍යුහයක් කතිපයාධිකාරී (oligopoly) වෙළෙඳපොළක් වේ.

**1.14** "ආර්ථික ක්ෂයවීම", වක්‍ර පිරිවැය සඳහා උදාහරණයකි.

*අංක **1.15** සිට **1.20** දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.15** ඉල්ලුම තීරණය කරනු ලබන සාධක දෙකක්(02) සඳහන් කරන්න.

**1.16** මිල සහ ඉල්ලුම් ප්‍රමාණය අතර ප්‍රතිලෝම (ඍණ) සම්බන්ධතාවයක් පැවතීමට හේතු දෙකක්(02) සඳහන් කරන්න.

**1.17** සැපයුම් මිල නම්‍යතාවය තීරණය කරනු ලබන සාධක දෙකක්(02) සඳහන් කරන්න.

**1.18** පරිමාණානුකූල ඵලයන්හි (Returns to Scale) අදියරයන් (stages) දෙකක්(02) සඳහන් කරන්න.

**1.19** ගිණුම්කරණ ලාභය සහ ආර්ථික ලාභය අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.

**1.20** කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලිය යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

(a) මිශ්‍ර ආර්ථික ක්‍රමයක (Mixed Economic System) ප්‍රධාන ලක්ෂණ තුනක්(03) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 03)

(b) වෙළෙඳපොළ ආර්ථික ක්‍රමය (Market Economic System) මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගන්නේ කෙසේදැයි යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(c) අවශ්‍යතා සහ වුවමනා අතර වෙනස, එකිනෙකට උදාහරණයක්ද සමඟ, **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## **03** වන ප්‍රශ්නය

(a) **A නිෂ්පාදිතයට** අදාලව ඉල්ලුම් සමීකරණය (Qd) සහ සැපයුම් සමීකරණය (Qs) පහත පරිදි වේ:

$$Qd = 16,600 - 3P$$

$$Qs = -6,000 + 2P$$

ඉහත සඳහන් තොරතුරු භාවිත කරමින්,

**ඔබ විසින් කළ යුතු දෑ:**

සමතුලිත මිල සහ ප්‍රමාණය (quantity) **ගණනය කරන්න**. (ලකුණු 04)

(b) රජය විසින් භාණ්ඩයක් මත සමතුලිත මිලට වඩා අඩුවෙන් උපරිම මිලක් පැනවීම මගින් ඇතිවිය හැකි ප්‍රතිවිපාක ප්‍රස්තාරයක් ආධාරයෙන් **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## **04** වන ප්‍රශ්නය

(a) පූර්ණ තරඟකාරී වෙළෙඳපොළක ලක්ෂණ හතරක්(04) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 04)

(b) ශ්‍රී ලංකාව වැනි රටකට උද්ධමනය නිසා ඇතිවිය හැකි ප්‍රතිවිපාක තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## **05** වන ප්‍රශ්නය

(a) "රටක් ආනයන පාලනය කිරීම සඳහා තීරුබදු (tariffs) යොදාගනී".

රටක් ජාත්‍යන්තර වෙළඳාම පාලනය සඳහා භාවිත කරන වෙනත් ක්‍රම දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) **X** සහ **Y** යන රටවල් දෙක, සහල් සහ තිරිඟු යන නිෂ්පාදිත දෙකම නිෂ්පාදනය කරයි. මෙම රටවල් දෙක එක් ශ්‍රම ඒකකයකින් නිපදවනු ලබන සහල් සහ තිරිඟු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ:

| **නිෂ්පාදිතය** / **රට** | **සහල් (කිලෝ ග්‍රෑම්)** | **තිරිඟු (කිලෝ ග්‍රෑම්)** |
|---|---|---|
| **X** | 8 | 2 |
| **Y** | 4 | 4 |

(i) එක් එක් නිෂ්පාදිතය නිෂ්පාදනයේදී, නිරපේක්ෂ වාසියක් (absolute advantage) ඇත්තේ කුමන රටකටද යන්න **සඳහන් කරන්න**. (ලකුණු 02)

(ii) එක් එක් නිෂ්පාදිතය නිෂ්පාදනයේදී, සාපේක්ෂ වාසියක් (comparative advantage) ඇත්තේ කුමන රටකටද යන්න **සඳහන් කරන්න**. *(ගණනය කිරීම් සමඟ තහවුරු කරන්න).* (ලකුණු 04)

(c) ගෙවුම් ශේෂ ලේඛණයේ ඇතුළත් ජංගම ගිණුමෙහි අඩංගු සංරචක (components) දෙකක්(02) **සඳහන් කරන්න**.

(ලකුණු 02)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 20)

### 06 වන ප්‍රශ්නය

(A) (a) රාජ්‍ය අයවැයෙහි ඇතුළත් පුනරාවර්තන (recurrent) වියදම් සහ ප්‍රාග්ධන (capital) වියදම් අතර ඇති වෙනස **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(b) වක්‍ර බද්දක් යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 02)

(B) (a) වසරක කාලයක් සඳහා ආර්ථිකයක ජාතික ගිණුම්වලට අදාල පහත සඳහන් උපකල්පිත දත්ත ඔබ වෙත ලබාදී ඇත:

| | **රු. මිලියන** |
|---|---|
| සේවක ආදායම | 7,500 |
| දළ මෙහෙයුම් අතිරික්තය | 13,600 |
| මිශ්‍ර ආදායම | 1,200 |
| නිෂ්පාදන සහනාධාර අඩුකළ පසු වෙනත් බදු | 150 |
| නිෂ්පාදන සහ ආනයන මත ශුද්ධ බදු | 2,000 |
| විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම | (1,400) |

**ඔබ විසින් කළ යුතු දෑ:**

ආදායම් ප්‍රවේශය (Income approach) භාවිත කරමින්, පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(i) මූලික මිල යටතේ දළ එකතු කළ අගය [Gross Value Added (GVA)]. (ලකුණු 05)

(ii) වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය [Gross Domestic Product (GDP)]. (ලකුණු 02)

(iii) වෙළෙඳපොළ මිලට දළ ජාතික ආදායම [Gross National Income (GNI)]. (ලකුණු 02)

(b) ජාතික ගිණුම් සැකසීමේ වැදගත්කම් හතරක්(04) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 04)

(C) රාජ්‍ය "ෆිස්කල් (Fiscal) ප්‍රතිපත්තිය" යන පදය **පැහැදිලි කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාළ කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |